# 19 සාමය

සාමයේ ජීවිත මග වෙත
මා යොමු කළ මැන ස්වාමිනේ
ජාතිය කුලය නිසා නොබෙදී
මානව බැතියෙන් එකමුතු වී
රට තුළ සමගිය ගොඩනංවන්නට
දෙන්නෑ වරම් ඔබගේ

**පුන ගැයුම:**

සමිඳේ අප ගුරු දෙවිඳේ
ඔබේ සැබෑ දහම් මගේ
පිය නංවමු නිබඳේ

ප්‍රේමයේ ජීවිත පිළිවෙත
දිරි ගන්වනු මැන ස්වාමිනේ
මුදු කරුණා ගුණයෙන් තෙත් වී
මෙත් මුදිතාවෙන් පිරිපුන් වී
මනු සත් වගට මැ සෙත් සලසන්නට
දෙන්නෑ වරම් ඔබගේ

සේවයේ ජීවන මං පෙත
හෙළිකර දෙනු මැන ස්වාමිනේ
පීඩිතයන් සිත සැනසුම දී
නැති බැරි අය හට අතහිත දී
ජන සෙත උදෙසා ඇප කැප වන්නට
දෙන්නෑ වරම් ඔබගේ

(කිතුනු ගී අංක 271)

ඉහත ගීතිකාව ගායනා කරන්න.
ගීතිකාවෙන් ඔබේ ජීවිතයට එකතු කර ගැනීමට ආරාධනා කරන ගුණාංග ලැයිස්තු ගත කරන්න.

## සාමය පිළිබඳ කිතුනු ඉගැන්වීම්

පැරණි ගිවිසුමේ "සාමය" සඳහා භාවිත කරන හෙබ්‍රෙව් වචනය "ෂාලොම්" (Shalom) ය. ෂාලොම් යනු ඇතුළාන්ත සාමය යි. ඇතුළාන්ත සාමයට මූලික වන්නේ සත්‍යය යුක්තිය, ප්‍රේමය හා නිදහස යි. ඇතුළාන්ත සාමය ඇති කිරීමට අන් අයට හා ඔවුන්ගේ

අයිතිවාසිකම්වලට ගරු කළ යුතු ය. ඒ අනුව යුද්ධය, ප්‍රචණ්ඩ ක්‍රියා යනාදිය නොමැති වීම යන්නට වඩා පුළුල් හා ගැඹුරු අර්ථයක් එහි අන්තර්ගත වේ.

මිනිස් ජීවිතය සුරැකීමට හා නඟාසිටුවීමට සාමය අවශ්‍ය වේ. යුක්තිය ගොඩනැගීම, අන් අයගේ අවශ්‍යතාවලට සංවේදී වීම, අන් අයට ගරු කිරීම හා සහෝදර දයාවෙන් කටයුතු කිරීම වැදගත් වේ.

සාමයේ කුමාරයාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට වැඩියේ ඇතුළාන්ත සාමය ස්ථාපිත කිරීමට ය. පාපයෙන් විනාශ වූ දෙවි මිනිස් සාමය උන්වහන්සේගේ කුරුසියේ මරණින් ස්ථාපිත කළ සේක. එපමණක් නොව "සාමය ඇතිකරන්නෝ භාග්‍යවන්තයෝ ය" කියමින් සාමය උදකිරීමට අපට ද ඇරයුම් කළ සේක (මතෙව් 5:9). තව ද සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කරමින් පාපයන්ට සමාව දී මිනිස් හදවත් තුළ ඇතුළාන්ත සාමය උදාකිරීමට ශුද්ධ වූ සභාවට පැවරූ සේක.

මිනිස් ජීවිතය සුරැකීමට හා නඟාසිටුවීමට සාමය අවශ්‍ය වේ. එම නිසා සාමය වනාහි ක්‍රිස්තුන් වහන්සේගේ ත්‍යාගයකි. ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීම යනාදිය කිතුනු දයාවට පටහැනි වේ. මෙවැනි හැඟීම් දිගින් දිගට ම සිත තුළ වර්ධනය වීමට සැලැස්වීම තව කෙනෙකුට අනතුරක් කිරීමට පවා පුද්ගලයා යොමු කරවයි. කායින්ට සිදු වූයේ ද එය යි. එබැවින් එවැනි හැඟීම් පාලනය කර ගැනීම වැදගත් වන බව ජේසුස් වහන්සේ උගන්වා වදාළ සේකː

> මම ඔබට කියමි, තමාගේ සහෝදරයා සමග කෝප වන කවරෙකු වුව ද ඔහු අධිකරණයට යටත් වනු ඇත. තමාගේ සහෝදරයාට "මෝඩයා" කියා ගරහන කවරෙකු වුව ද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත; "ජඩයා" කියා ගරහන කවරෙකු වුව ද ඔහු නිරාගින්නට ගොදුරු වනු ඇත.
>
> (මතෙව් 5:22)

සතුරාට ප්‍රේම කරමින්, හිංසා කරන අය වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල ප්‍රධාන තේමාවකිː

> ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න; ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. මෙසේ ඔබ ස්වර්ගයෙහි වැඩ සිටින ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නහු ය. කුමක් නිසා ද, උන් වහන්සේ දුදනන් හට හා සුදනන් හට තම හිරු එළිය උදා කරවන සේක; දැමිටුන් හට හා අදැමිටුන් හට වැසි වස්සන සේක.
>
> (මතෙව් 5:44-45)

සාමය ගොඩනැගීමට:

- සාධාරණත්වය අවශ්‍ය ය.
- දයාව අවශ්‍ය ය.
- දුබලයා ආරක්ෂා කළ යුතු ය.
- ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කළ යුතු ය.
- මිනිස් ඝාතන නොකළ යුතු ය.
- මිනිස් අයිතිවාසිකම් සුරැකිය යුතු ය.

**යුද්ධය පිටුදැකීම**

- යුද්ධය හා අවි ආයුධ රැස් කිරීම භයානක වේ
- යුද්ධය සඳහා වියදම් කරන මුදල්වලින් ලෝකයේ දිළිඳුභාවය තුරන් කළ හැකි ය
- යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හා ඇතුළාන්ත සාමය ගොඩනැගීම ක්‍රිස්තියානි යුතුකම වේ
- අවි ආයුධ නිපදවීම හා යුද්ධය පිටුදැකීමට විවිධ සංවිධාන කටයුතු කළ යුතු ව ඇත.



19.1 රූපය - අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමා

**අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාව**

ස්වාමීනි, මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව. වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද අසමගියේ තුවාලයන්ට ශාන්තිය ද අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද බලාපොරොත්තු සුන් වූ තැනට බලාපොරොත්තුව ද ශෝකය වටලා ගත් තැනට ප්‍රීතිය ද අඳුරින් වැසී ගිය තැනට ආලෝකය ද ගෙන යාමට මට වරම් දුන මැනව. සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද තේරුම් ගනු ලැබීමට වඩා තේරුම් ගැනීමට ද ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද මා යොමු කළ මැනව. මක්නිසාද යත් දීමෙන් අපට ලැබීමත් සමාව දීමෙන් සමාවත් මරණයෙන් අපට සදා ජීවිතයත් අත්වන නිසා ය.

## අප ද සාමයේ අවි විය යුතු ය

සාමයේ කුමාරයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීම තුළින් අත්දකින සාමය එකිනෙකා හා බෙදා ගැනීමට කටයුතු කළ යුතු ය. කරදර බාධක බොහොමයක් සහිත වටපිටාවක දී ජේසුස් වහන්සේගේ වැඩ සිටීම කෙරෙහි දැඩි විශ්වාසයකින් යුතු ව ඇතුළාන්ත සාමයක් අත්දකින්නට නිරතුරු ව ම පුහුණු විය යුතු ය.



- සැම විට ම සන්සුන් ව සිටින්න
- කිසි විටෙකත් යහපතට විරුද්ධ නොවන්න
- සුසිත් බව ඇති කර ගන්න
- යුක්තියට, සත්‍යයට හා සාධාරණත්වයට හිස නමන්න
- ලැබුණු දෙයට ස්තුති කරන්න
- දුන් දෙය අමතක කරන්න. ලැබුණු දෙය මතක තබා ගන්න
- අන් අයට ශුභාරංචිය ප්‍රකාශ කරන්න.

**ක්‍රියාකාරකම**

1. පාසල් සමාජය තුළ සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි මාර්ග **පහක්** නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න.
2. ශ්‍රී ලංකාවේ ජනතාව අතර සාමය නැංවීම සඳහා ශුද්ධ වූ සභාවට පැවරෙන වගකීම් **පහක්** ලියන්න.
3. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය." යන ශීර්ෂය යටතේ පාසලේ බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කරන්න. (වචන 100ක් ප්‍රමාණවත් ය)
4. අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමා ඉදිරිපත් කළ යාච්ඤාවෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ **පහක්** පෙළ ගස්වන්න.



**ජීවිතයට බිඳක්**

***නික්මීමෙන් කටයුතු කර සාමය ඇති කරමු.***